

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

# වාර්ෂික වාර්තාව 2017

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 26 වැනි වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කරන ලදී.**

Sinhala Version

Tamil Version

English Version



**ප්‍රකාශක :**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

අංක 36, මලලසේකර මාවත

කොළඹ 07

**මුද්‍රණය:**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අංක 118, ඩෑනිස්ටර් ද සිල්වා මාවත

කොළඹ 08

**ප්‍රකාශන අයිතිය:**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව මෙම වාර්තාවේ කොටසක් හෝ යම් තොරතුරක් උපුටා ගැනීම සපුරා තහනම්.**

## මෙහෙවර

***අල්ලසට, දූෂණයට සහ නීති විරෝධී ලෙස වත්කම් ඉපයීමට එරෙහි වූ සටනට, සාධාරණ සහ යුක්ති සහගත ක්‍රමවේද තුළින් නිවාරණය සහ නඩු පැවරීම මගින් පුරෝගාමීව කටයුතු කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරම මෙහෙවර වේ.***



# අන්තර්ගතය


**01. හැඳින්වීම.** 6
1.1. කොමිෂන් සභාව
1.2. අල්ලස් සහ දූෂණ වැලැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්
**02. කොමිෂන් සභාව** **7**
2.1. කොමිෂන් සභාව වෙත කරනු ලබන දැනුම්දීම්
2.2. ලේකම් කාර්යාලය
2.3. 2017 වසරේ පැමිණිලි ලැබීමේ ස්වභාවය
2.3.1. 2014-2017 දක්වා ලද පැමිණිලි
2.3.2. 2017වසරේ ලද පැමිණිලි සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ග
2.3.3. 2007-2017 වර්ෂවල වරදට දඬුවම් ලබා දීමේ ප්‍රගතිය
**03. අධ්‍යක්ෂ ජනරාල්** 13
3.1. පත් කිරීම
3.2. වගකීම්
**04. විමර්ශන අංශය** 14
4.1. අධ්‍යක්ෂ විමර්ශන
4.2. නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) සහ සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)
4.3. ස්ථානාධිපති අල්ලස්
4.3.1. දූෂණ විමර්ශන ඒකකය
4.3.2. විවෘත විමර්ශන ඒකකය
4.3.3. වත්කම් විමර්ශන ඒකකය
4.3.4. වැටලීම් ඒකක 1,2,3 සහ 4
4.3.5. උසාවි මෙහෙයුම් ඒකකය
4.3.6. පාලන ඒකකය
4.4 .2017 වර්ෂයේ විමර්ශනය කරන ලද පැමිණිලි සහ විමර්ශන ප්‍රගතිය
4.5. 2017 වර්ෂයේ වැටලීම්
4.6 .2017 වර්ෂයේ අත්අඩංගුවට ගන්නා ලද නිලධාරින් අයත් ආයතන
**05. නීති අංශය** 19
5.1. 2017 වර්ෂයේ නඩු පැවරීම්
5.2.2017 වර්ෂයේ අධිකරණවල පැවරූ මුළු නඩු පිළිබඳ තොරතුරු
5.3. 2014 සිට 2017 දක්වාඅදාළ වර්ෂවලදි පවරන ලද නඩු සංඛ්‍යාව
5.4.2017 වර්ෂයේ අධිකරණය විසින් අවසන් කරන ලද නඩු සංඛ්‍යාව
5.5. අධිකරණයේ පවරන ලද නඩු අතරින් අදාළ වර්ෂවල දී අවසන් කරන ලද නඩු සංඛ්‍යාව
**06. පාලන අංශය** 22
6.1. 2017.12.31 දිනට නීති සහ පාලන අංශයේ සිටින නිලධාරි සංඛ්‍යාව සහ පුරප්පාඩු
6.2. මානව සම්පත් සංවර්ධනය
6.3. ප්‍රවාහන අංශය
**07. මුදල් අංශය** 30
7.1. මුදල් අංශයේ කාර්යභාරය
7.2. වාර්ෂික ඇස්තමේන්තු සත්‍ය වියදම් සහ ඉතිරි කිරීම්
**08. නිවාරණ ඒකකය** 31
8.1. දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්
**09. අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සම්බන්ධීකරණයන්.** 33
9.1. නීති සංශෝධනය කිරීම
9.2. ජාතික ක්‍රියාකාරී සැලැස්ම
9.3. අන්තර් ජාතික වගකීම්
9.4. සුපිළිපන්න වැඩසටහන්
9.5. විශේෂඥ විමර්ශනයන් සහ නිවාරණ ඒකකය
9.6. නිලධාරීන්ගේ වැටුප් වැඩිකිරීම හා වෙනම සේවා ගණය
9.7. නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම
9.8. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු අනුමත කර ගැනීම
9.9. නිලධාරීන් බඳවා ගැනීම

## 01. හැඳින්වීම

**1954 අංක 11 දරන අල්ලස් පනත මඟින් ස්ථාපනය කරන ලද අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව අහෝසි කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 1994 අංක 19 දරන පනත යටතේ පිහිටුවා ඇති අතර, එය 1994 දෙසැම්බර් මස 15 දින සිට ක්‍රියාත්මක විය.**

### 1.1. කොමිෂන් සභාව

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 (ආ) වගන්තිය ප්‍රකාරව හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත අතිගරු ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් වර්ෂ පහක ධූර කාලයක් සඳහා පත් කරනු ලැබේ.

කොමිෂන් සභාව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන් විය යුතුය. කොමිෂන් සභාවේ තෙවන සාමාජිකයා අපරාධ විමර්ශනය හා නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පුළුල් පළපුරුද්දක් ඇති තැනැත්තෙකු විය යුතුය. කොමිෂන් සභාවේ සභාපති ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන්ගෙන් එක් අයෙකු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබයි.

පස්වන කොමිෂන් සභාවේ සාමාජිකයන් ( 2015 ඔක්තෝම්බර් මස 20 )

| තනතුර | නම | වෙනත් තොරතුරු |
|---|---|---|
| සභාපති | විනිසුරු ටී.බී.වීරසූරිය මහතා | විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු |
| කොමසාරිස් | විනිසුරු ඩබ්ලිව්. ලාල් රංජිත් සිල්වා මහතා | විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු |
| කොමසාරිස් | සී.නෙවිල් ගුරුගේ මහතා | විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි |

### 1.2. අල්ලස් හෝ දූෂණ වැලැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්

(1) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා කොමිෂන් සභාවට සහාය වීම පිණිස ජනාධිපතිවරයා විසින් අල්ලස් හෝ දූෂණ වැලැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරනු ලබයි. මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස 2016.11.24 දින සිට ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා කටයුතු කරයි.

තවද මෙම කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා සහාය වීම පිණිස නීති නිලධාරීන්, විමර්ශන නිලධාරීන් සහ රජයේ ඒකාබද්ධ සේවයෙන් තෝරා ගන්නා ලද නිලධාරීන් ද කොමිෂන් සභා කාර්යාලයට අනුයුක්තව සිටියි. මෙම කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කර ඇති සියලු නිලධාරීන් කොමිෂන් සභාව වෙත ලැබෙන තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට බැඳී සිටී.

## 02. කොමිෂන් සභාව

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 (ආ) වගන්තිය ප්‍රකාර ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් වර්ෂ පහක ධූර කාලයක් සඳහා පත් කරනු ලැබේ.

කොමිෂන් සභාව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන් විය යුතුය. තෙවන සාමාජිකයා අපරාධ විමර්ශනයට හා නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ පුළුල් පළපුරුද්දක් ඇති අයෙකු විය යුතුය. කොමිෂන් සභාවේ සභාපති ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන්ගෙන් එක් අයෙකු පත් වේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 4 වන වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවට යම් දැනුම් දීමක් කරනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුය. එසේ වුවද එවැනි පැමිණිල්ලක් පිළිබඳව විමර්ශන කටයුතු දියත් කිරීමට පෙර එම පැමිණිල්ල නිර්ව්‍යාජ බවට සහ විමර්ශනයක් කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත් විය යුතුය.

කොමිෂන් සභාව වෙත කෙරෙන යම් දැනුම් දීමක් මඟින් යම් තැනැත්තෙකුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනාවක් හෝ යම් ධනය හෝ දේපල අත්කර ගැනීමක් හෝ මෑතකදී පුද්ගලයෙකු විසින් කරනු ලැබූ මුදල් හෝ ව්‍යාපාරික ගනුදෙනු හෝ වියදම් එම පුද්ගලයාගේ ප්‍රකට ආදායම් ප්‍රභවයන් හා නොගැලපෙන බවට කරුණු අනාවරණය වේ නම්, එම දැනුම් දීම නිර්ව්‍යාජ බවට කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් , අවස්ථානුකූලව කොමිෂන් සභාව විසින් විමර්ශනයක් පැවැත්විය හැකි ය. එහි දී අල්ලස් පනතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ නඩු පැවරීම හෝ වෙනත් යෝග්‍ය ක්‍රියා මාර්ගයක් ගැනීම හෝ වෙනත් යම් නීතියක් යටතේ නඩු පැවරීම පිළිබඳ තීරණයකට එළඹීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශනයක් කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බලතල 1994 අංක 19 දරන පනතේ 5 වන වගන්තිය මඟින් ප්‍රධානය කර ඇත.

කොමිෂන් සභාවට ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා ගෙන යන අතරතුර දී යම් පුද්ගලයෙකු විසින් 1994 අංක 19 දරන පනත යටතේ හා 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වරදක් කර ඇති බවට කොමිෂන් සභාවට හැඟී යන්නේ නම් ඒ අදාළ පුද්ගලයාට විරුද්ධව අදාළ අධිකරණයක නඩු පැවරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කළ හැකි වන්නේ ය.

කොමිෂන් සභා පනතේ 9 වන වගන්තිය මගින් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිනු ලබන පුද්ගලයෙකු සතු වරප්‍රසාද හා පරිහාර පිළිබඳ නියමයන් සඳහන් කර ඇත්තේ ය.

කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය මගින් සලසා ඇති විධිවිධානය ප්‍රකාරව කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකු විසින් ද, අධ්‍යක්ෂවරයා සහ කොමිෂන් සභාවට සහාය වීම පිණිස පත් කරන ලද සෑම නිලධාරියෙකු හා සේවකයෙකු විසින් ද ස්වකීය ධූරයේ කාර්යය භාර ගැනීමට ප්‍රථම මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කරතව්‍ය ඉටු කිරීමේ දී තමන්ට ලැබෙන හෝ තමන්ට දැන ගැනීමට ලැබෙන තොරතුරු කිසිවක් අනාවරණය නොකරන බවට ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය.

### 2.1. කොමිෂන් සභාව වෙත කරනු ලබන දැනුම් දීම

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සම්බන්ධයෙන් දැනුම් දිය හැකි ආකාරය.**

**i. කොමිෂන් සභාව වෙත පැමිණීමෙන්**

ii. ලිඛිතව(නාමිකව හෝ නිර්නාමිකව)
iii. දුරකථන මාර්ගයෙන්

- ක්ෂණික ඇමතුම — 1954
- අධ්‍යක්ෂ විමර්ශන — 011-2586841
- කොමිෂන් සභා කාර්යාලය — 011-2586257
- ෆැක්ස් — 011-2595045
- ඊ මේල් — ciaboc@eureka.ik

## 2.2. ලේකම් කාර්යාලය


කොමිෂන් සභාව වෙත ලැබෙන සියලු පැමිණිලි ලියාපදිංචි කර සුදුසු නියෝග ලබා ගැනීම සඳහා, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලැබේ. මෙම අංශයේ ප්‍රධානියා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්.එම්.වී.ශාන්ති ජයසේකර මහත්මිය 2017.04.05 වන දින සිට කටයුතු කරයි.

## 2.3. 2017 වර්ෂයේ පැමිණිලි ලැබීමේ ස්වභාවය

වර්ෂය තුළ ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 2768 ක් වන අතර, එහි වර්ගීකරණය පහත දැක්වේ.


| | |
|---|---|
| නාමික පැමිණිලි | 1233 |
| නාමික පැමිණිලි | 1473 |
| වැටලීම් | 62 |
| එකතුව | 2768 |

### 2017 වර්ෂයේ ලද පැමිණිලි සංඛ්‍යාව පිළිබඳ විශ්ලේෂණය.



### 2.3.1. 2014 - 2017 වර්ෂය දක්වා ලද පැමිණිලි


| වර්ෂය | ලද පැමිණිලි සංඛ්‍යාව | වැඩිදුර විමර්ශනය සඳහා තෝරා ගෙන ඇති පැමිණිලි සංඛ්‍යාව | ඒවා පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | අල්ලස් | දූෂණ | වත්කම්/ බැරකම් හෙළි නොකිරීම | අයුතු වත්කම් ඉපයීම |
| 2014 | 2345 | 893 | 357 | 418 | - | 118 |
| 2015 | 3964 | 1823 | 421 | 1173 | - | 229 |
| 2016 | 3450 | 2435 | 465 | 1503 | - | 467 |
| 2017 | 2768 | 1652 | 417 | 983 | - | 169 |



### 2.3.2. 2017 වසරේ ලද පැමිණිලි සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ග

- **2017 වර්ෂයේ ලද පැමිණිලි වලින් වැඩිදුර විමර්ශනයට භාජනය කිරීම සඳහා තීරණය කරන ලද හා වැටලීම් සිදු කළ පැමිණිලි සංඛ්‍යාව.**

| අල්ලස් පැමිණිලි | දූෂණ පැමිණිලි | අයුතු වත්කම් ඉපයීම | වැටලීම් | එකතුව |
|---|---|---|---|---|
| 417 | 983 | 173 | 79 | 1652 |




- **2017 වර්ෂයේ දී ලද පැමිණිලිවලින් වැඩිදුර විමර්ශනය නොකිරීමට තීරණය කරන ලද පැමිණිලි**

| විස්තර | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| කොමිෂන් සභා පනතට අනුකූල නොවන බැවින් වැඩිදුර කටයුතු කිරීම සඳහා වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 334 |
| පනතට අදාළ නොවීම, ප්‍රමාණවත් කරුණු නොතිබීම සහ අපහැදිලි බව හේතුවෙන් වසා දමන ලද පැමිණිලි සංඛ්‍යාව | 397 |
| **එකතුව** | **731** |

- වැඩිදුර විමර්ශනයක් කරන්නේද නැද්ද යන්න තීරණය කිරීමට ඇති පැමිණිලි

| විස්තර | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| වෙනත් ආයතනවලින් වාර්තා කැඳවීමට කටයුතු කරන පැමිණිලි සංඛ්‍යාව | 382 |
| විමර්ශන ආරම්භ කරන්නේ ද යන්න සලකා බැලීමට නීති වාර්තා කැඳවීමට නියම කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 03 |
| **එකතුව** | **385** |


- **2017.12.31 දිනට කොමිෂන් සභාව මගින් අවසන් කරන ලද පැමිණිලි**

| විමර්ශනයට පෙර | විමර්ශනයට පසු | එකතුව |
|---|---|---|
| 731 | 410 | 1141 |


### 2.3.3. 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වරදට දඬුවම් ලබා දීමේ ප්‍රගතිය.

| වර්ෂය | පැවරු මුළු නඩු සංඛ්‍යාව | අවසන් කල නඩු සංඛ්‍යාව | වරදකරුවන් ගණන |
|---|---|---|---|
| 2007 | 91 | 33 | 12 |
| 2008 | 63 | 20 | 14 |
| 2009 | 43 | 56 | 24 |
| 2010 | 67 | 38 | 17 |
| 2011 | 34 | 40 | 20 |
| 2012 | 77 | 60 | 33 |
| 2013 | 58 | 55 | 17 |
| 2014 | 64 | 58 | 22 |
| 2015 | 108 | 52 | 15 |
| 2016 | 87 | 34 | 15 |
| 2017 | 73 | 89 | 57 |

- **2012 - 2017 වර්ෂවල අවසන් කල නඩු සංඛ්‍යාවේ වර්ධනය**




- **2012 – 2017 වර්ෂය දක්වා වරදකරුවන්වීමේ වර්ධනය**



## 03. අධ්‍යක්ෂ ජනරාල්

### 3.1. පත් කිරීම

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට සහාය වීම පිණිස ජනාධිපතිවරයා විසින් අල්ලස් හෝ දූෂණ වැලැක්වීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරනු ලබයි.

### 3.2. වගකීම

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව අල්ලස් පනතේ II වන කොටස යටතේ වරදක් හෙළිදරව් වන්නා වූ ද, තුටු පඩුරක් හෝ වටිනාකම රුපියල් දෙදහසක් නොයික්මවන තුටු පඩුරක් අයදීම, භාර ගැනීම හෝ පිරිනැමීම පිළිබඳ තොරතුරු හෙළිදරව් වන අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයේ දී ද, රුපියල් 2000/- කට වැඩි වටිනාකමකින් යුත් තුටු පඩුරක් අයැදීම, භාර ගැනීම හෝ පිරිනැමීම පිළිබඳ කරුණු හෙළිදරව් වන්නේ නම් මහාධිකරණයක් ඉදිරියේ දී ද නඩු පැවරීම සඳහා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධානය කරනු ලබයි. කොමිෂන් සභාවේ විධානය පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා අත්සන් තබන ලද අධි චෝදනා පත්‍රයක් යටතේ මහාධිකරණයේ නඩු පවරන ලද අවස්ථාවක එම අධිචෝදනා පත්‍රය නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අධි චෝදනා පත්‍රයක් මෙන් එය විභාග කිරීම සඳහා මහාධිකරණයට බලය ඇත්තේය.

අල්ලස් වලින් අත්කර ගත් දේපළ හෝ අල්ලස් වලින් අත්කරගත් දේපළකින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපළ සම්බන්ධයෙන් අල්ලස් පනතේ 23 ‘අ’ වගන්තිය යටතේ වන වත්කම් අත්පත් කර ගැනීම පිළිබඳ අවස්ථාවක දී (අල්ලස් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව) මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයක් ගොනු කිරීම මඟින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නඩු පවරනු ලැබිය යුතුය. අල්ලස් පනතේ 70 වන වගන්තිය ප්‍රකාරව දූෂණ වරදක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතුය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 849/15 සහ 1994.12.15 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව අල්ලස් පනතේ II කොටසේ තුටු පඩුරක් පිරිනැමීම,අයැදීම,භාර ගැනීම වැරදි සම්බන්ධයෙන් ද අල්ලස් පනතේ V කොටසේ සියළු වැරදි සම්බන්ධයෙන් ද අධිකරණ බලය කොළඹ පැවැත්වෙන මහේස්ත්‍රාත් අධිකරණයේ සහ මහාධිකරණයේ දී අවස්ථානුකූලව නඩු පවරනු ලබයි.තවද ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ කරන ලද වැරදි සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ උපදෙස් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබිය යුතුය.

ඉහත සඳහන් වගකීම්වලට අමතරව අල්ලස් හා දූෂණය වැළැක්වීම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස පරිපාලන කටයුතු පිළිබඳ වගකීව යුතුය. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අධ්‍යක්ෂ (පාලන) හා ප්‍රධාන ගණකාධිකාරී යන නිලධාරීන්ගේ සහාය ලැබේ.

## 04. විමර්ශන අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ සියලු විමර්ශන කටයුතු සිදුකරනු ලබන්නේ මෙම කොමිෂන් සභාවේ ස්ථාපනය කර ඇති විමර්ශන අංශය මඟිනි.

අංක 1954 අංක 11 දරන අල්ලස් පනතේ හා 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ පවරා දී ඇති බලතල අනුව විමර්ශන අංශයට නිලධාරීන් පත්කොට විමර්ශන කටයුතු සිදුකරනු ලබයි.

අධ්‍යක්ෂ (විමර්ශන) වරයෙකුගේ ප්‍රධානත්වයෙන් මෙම අංශයේ කටයුතු පවත්වාගෙන යනු ලබන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) වරුන් දෙදෙනෙකු යටතේ විමර්ශන කටයුතු ඒකකවලට බෙදා ඇත. එම අංශවල ස්ථානාධිපතිවරුන් ලෙස පළපුරුදු නිලධාරීන් පත් කර ඇත.

මෙම විමර්ශන අංශය ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවෙන් පත් කර ගත් පොලිස් නිලධාරීන් 209 දෙනෙකුගෙන් සමන්විත වේ.

#### විමර්ශන අංශය බෙදා ඇති ඒකක නවය

1. දූෂණ විමර්ශන ඒකකය
2. විවෘත විමර්ශන ඒකකය
3. වත්කම් විමර්ශන ඒකකය
4. වැටලීම් ඒකක 1
5. වැටලීම් ඒකක 2
6. වැටලීම් ඒකක 3
7. වැටලීම් ඒකක 4
8. උසාවි මෙහෙයුම් ඒකකය
9. පාලන ඒකකය

### 4.1. අධ්‍යක්ෂ (විමර්ශන)

විමර්ශන අංශයේ පරිපාලන කටයුතු හා සියලුම විමර්ශන ඒකකවල අධීක්ෂණය අධ්‍යක්ෂ (විමර්ශන) යටතේ සිදු වේ. මෙම තනතුරේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී.ප්‍රියන්ත චන්ද්‍රසිරි මහතා කටයුතු කරනු ලබයි.

කොමිෂන් සභාව විසින් හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යොමු කරනු ලබන සියලුම විමර්ශන අදාළ ඒකක වෙත තම අධීක්ෂණය යටතේ යොමු කර විමර්ශනය කරවීම හා උපදෙස් ලබා දීම, ඒවායේ ප්‍රගතිය නැවත කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදු කරයි.

### 4.2. නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) හා සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)

විමර්ශන අංශයේ පරිපාලන කටයුතු හා විමර්ශන කටයුතු සඳහා අධ්‍යක්ෂ (විමර්ශන) වෙත සහාය දීම සඳහා පත් කර ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) තනතුර පුරප්පාඩුව පවතින අතර, සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) ලෙස කාන්තා සහකාර පොලිස් අධිකාරී ඩබ්ලිව්.ජේ.පද්මිණී මහත්මිය කටයුතු කරයි.

### 4.3. ස්ථානාධිපති (අල්ලස්)

ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.පී.ලියනගේ මහතා මෙම තනතුර දරන අතර විමර්ශන අංශයට අනුයුක්ත සියලු ම විමර්ශන නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

තවද දූෂණ විමර්ශන ඒකකය හා විවෘත විමර්ශන ඒකකයේ විමර්ශනවල අධීක්ෂණ කටයුතු කර එහි ප්‍රගතිය කොමිෂන් සභාවට හා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීම සිදු කරනු ලබයි.

### 4.3.1. දූෂණ විමර්ශන ඒකකය

මෙම අංශ 4 ක් පවතින අතර, දූෂණ විමර්ශන I අංශය ප්‍රධාන පොලිස් පරීක්ෂක පී.ජී.සුමේන්ද්‍ර මහතාගේ ද, දූෂණ විමර්ශන II අංශය ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.බී.නාලක නුවන්සිරි මහතාගේ ද, දූෂණ විමර්ශන III අංශය පොලිස් පරීක්ෂක කේ.එල්.විජේසිරි මහතාගේ ද, දූෂණ විමර්ශන IV අංශය උප පොලිස් පරීක්ෂක යූ.පී.වික්‍රමාරච්චි මහතාගේ ද ප්‍රධානත්වයෙන් පවත්වා ගෙන යනු ලබයි.

කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ලැබෙන අල්ලස් පනතේ 70 වන වගන්තිය ප්‍රකාරව සිදු කර ඇති දූෂණ වැරදි සම්බන්ධව විමර්ශන පැවැත්වීම හා ඒවායේ ප්‍රගතිය ඇතුළත් වාර්තා අධීක්ෂණ නිලධාරියා වෙත යොමු කිරීම මෙම අංශයේ කාර්යය වේ.

### 4.3.2. විවෘත විමර්ශන ඒකකය

මෙම ඒකකය පොලිස් පරීක්ෂක ඒ.එන්.වීරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ගෙන යනු ලබයි.

අල්ලස් අයැදීම, ලබා ගැනීම, පිරිනැමීම ආදී දැනට සිදු වී අවසන්ව ඇති පැමිණිලි සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව විමර්ශන සිදු කර ඒවායේ ප්‍රගතිය ඇතුළත් වාර්තා අධීක්ෂණ නිලධාරියා වෙත යොමු කිරීම මෙම ඒකකයේ කාර්යය වේ.

### 4.3.3. වත්කම් විමර්ශන ඒකකය

මෙම ඒකකය පොලිස් පරීක්ෂක ඊ.එන්.අයි.ධර්මදාස මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වාගෙන යනු ලබන අතර අල්ලස් පනතේ 23 (අ) යටතේ අයථා වත්කම් ඉපයීම සහ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ලැබෙන පැමිණිලි විමර්ශනයට ලක් කර ප්‍රගතිය අධීක්ෂණ නිලධාරියා වෙත වාර්තා කිරීම මෙහි කාර්ය භාරය වේ.

### 4.3.4. වැටලීම් ඒකක 1, 2, 3 සහ 4

වැටලීම් ඒකක 1 උප පොලිස් පරීක්ෂක එම්.එච්.ඩී.එල්.ඩී.අප්පුහාමි මහතා විසින් ද , වැටලීම් ඒකක 2 උප පොලිස් පරීක්ෂක ඒ.එම්.කරුණාසිංහ මහතා විසින් ද, වැටලීම් ඒකක 3 උප පොලිස් පරීක්ෂක ඒ.ආර්.ඩබ්.එම්.බී.ඩබ්.එස්.බණ්ඩා මහතා විසින් ද, වැටලීම් ඒකක 4 ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්.ඩී.ජේ.පුෂ්පකුමාර මහතා විසින් ද පවත්වා ගෙන යනු ලබයි.

කොමිෂන් සභාව වෙත අල්ලස් අයදීම, භාර ගැනීම, පිරිනැමීම යන අවස්ථාවන් වලදී ලැබෙන පැමිණිලි සම්බන්ධව ක්ෂණිකව ක්‍රියාත්මක වී වැටලීම් සිදු කිරීම සහ විමර්ශන කටයුතු කඩිනමින් සිදු කර අධීක්ෂණ නිලධාරියා වෙත වාර්තා කිරීම මෙම ඒකකවල ප්‍රධාන කාර්යය වේ.

### 4.3.5. උසාවි මෙහෙයුම් ඒකකය

මෙම ඒකකය උප පොලිස් පරීක්ෂක කේ.කේ.ප්‍රේමසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ගෙන යනු ලබයි.

මෙම කොමිෂන් සභාව මඟින් පවරනු ලබන නඩු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නීති අංශයට අවශ්‍ය සහාය ලබා දීම, අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති සැකකරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, අධිකරණයේ නියෝග අනුව සැකකරුවන් අධීක්ෂණය කිරීම හා සිතාසි වරෙන්තු ක්‍රියාත්මක කිරීම ආදී කටයුතු මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.

### 4.3.6. පාලන ඒකකය

මෙම ඒකකය උප පොලිස් පරීක්ෂක එන්.එස්.එස්.ඒ.නන්දසේන මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ගෙන යනු ලබයි.

විමර්ශන අංශයට අනුයුක්ත සියලුම පොලිස් නිලධාරීන්ගේ පරිපාලනමය කටයුතු සිදු කරනු ලබන්නේ මෙම ඒකකය මඟිනි.

## 4.4. 2017 වර්ෂයේ විමර්ශනය කරන ලද පැමිණිලි සහ විමර්ශන ප්‍රගතිය.

| 2017 වර්ෂය සඳහා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | | 2017 වර්ෂයේ මුළු පැමිණිලි සංඛ්‍යාව | පසුගිය වර්ෂවලින් ඉදිරියට ගෙන ආ ගොනු සංඛ්‍යාව | විමර්ශනය සඳහා වූ ගොනු සංඛ්‍යාව | විමර්ශන අවසන් කල ගොනු සංඛ්‍යාව | 2017.12. 31 දිනට විමර්ශනය වෙමින් පවතින ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| අල්ලස් | දූෂණ | වත්කම් | | | | | |
| 790 | 1819 | 543 | 3152 | 3199 | 6351 | 3425 | 2926 |

2017 වර්ෂය සඳහා කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 1652 ක් විමර්ශන අංශය වෙත යොමු කර ඇත. එක් පැමිණිල්ලක පුද්ගලයින් කිහිප දෙනකු වෙත චෝදනා එල්ල වීම, අල්ලස් මෙන්ම දූෂණ වරද යටතේ චෝදනා එල්ල වීම හා අයථා වත්කම් රැස් කිරීම සහ වත්කම් ප්‍රකාශ නොකිරීම වැනි චෝදනා යටතේ උපගොනු විවෘත වීම මත විමර්ශන අංශයේ වාර්තා වන පැමිණිලි ප්‍රමාණය වැඩි අගයක් ගෙන ඇත.

## 4.5. 2017 වර්ෂයේ වැටලීම්

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| මුළු වැටලීම් සංඛ්‍යාව | 79 |
| සාර්ථක වැටලීම් සංඛ්‍යාව | 36 |
| කල් යන ලද වැටලීම් වලින් සාර්ථක සංඛ්‍යාව | 3 |
| අසාර්ථක වැටලීම් සංඛ්‍යාව | 20 |
| කල් යන ලද වැටලීම් සංඛ්‍යාව | 23 |
| අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව | 51 |

වැටලීම් අසාර්ථක වීම සඳහා පහත කරුණු බලපා ඇත.

- **අසත්‍ය පැමිණිලි ඉදිරිපත් කිරීම.**
- **වැරදි උපකල්පනයන් මත පැමිණිලි ඉදිරිපත් කිරීම.**
- **පැමිණිලි කිරීමෙන් පසු ඇතිවන බිය නිසා විමර්ශන නිලධාරීන්ට සහාය දීමට මැලිකමක් දැක්වීම.**

### 4.6. 2017 වර්ෂයේ අත්අඩංගුවට ගන්නා ලද නිලධාරීන් අයත් ආයතන.

| ආයතනය හා අත්අඩංගුවට පත් නිලධාරියාගේ තනතුර | අත් අඩංගුවට පත් නිලධාරීන් සංඛ්‍යාව | අත් අඩංගුවට පත් මුළු නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| **අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | |
| ▪ විදුහල්පති | 02 | |
| ▪ නියෝජ්‍ය විදුහල්පති | 01 | 03 |
| **කම්කරු දෙපාර්තමේන්තුව** | | |
| ▪ කම්කරු නිලධාරී | 01 | 01 |
| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | |
| ▪ ග්‍රාම නිලධාරී | 04 | |
| ▪ ජනපද නිලධාරී | 01 | |
| ▪ කාර්මික නිලධාරී | 01 | |
| ▪ සිවිල් පුද්ගලයින් | 02 | 08 |
| **ප්‍රාදේශීය සභා/නගර සභා** | | |
| ▪ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති | 01 | |
| ▪ ප්‍රාදේශීය සභා ලේකම් | 01 | |
| ▪ ඕවසියර් | 01 | |
| ▪ මාර්ග කම්කරු | 01 | |
| ▪ කාර්යාල කාර්ය සහායක | 01 | 05 |
| **ශ්‍රී ලංකා පොලීසිය** | | |
| ▪ උප පොලිස් පරීක්ෂක | 02 | |
| ▪ පොලිස් සැරයන් | 05 | |
| ▪ පොලිස් කොස්තාපල් | 03 | |
| ▪ ආරක්ෂක සහායක | 01 | |
| ▪ සිවිල් පුද්ගලයින් | 01 | 12 |
| **මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය** | | |
| ▪ සිවිල් පුද්ගලයින් | 01 | 01 |
| **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව** | | |
| ▪ වන ක්ෂේත්‍ර නිලධාරී | 01 | |
| ▪ බීට්ටු වන නිලධාරී | 01 | 02 |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | |
| ▪ සුරාබදු පරීක්ෂක | 01 | |
| ▪ රියදුරු | 01 | |
| ▪ සුරාබදු නියාමක | 01 | 03 |
| **සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** | | |
| ▪ කායික රෝග විශේෂඥ වෛද්‍ය | 01 | |
| ▪ මහජන සෞඛ්‍ය පරීක්ෂක | 01 | 04 |
| ▪ සෞඛ්‍ය කාර්ය සහායක | 01 | |
| ▪ සිවිල් සහායක | 01 | |
| **ශ්‍රී ලංකා යුධ හමුදාව** | | |
| ▪ යුධ හමුදා සෙබල | 01 | 01 |
| **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව** | | |
| ▪ සිවිල් පුද්ගලයින් - අදාළ රාජකාරියක් ඉටු කර ගැනීමට යාමේ දී | 02 | |
| ▪ කාර්යාල කාර්ය සහායක | 01 | 03 |

| | | |
|---|---|---|
| **මහජන බැංකුව අනුබද්ධිත පීපල්ස් ඉන්ෂුවරන්ස්**<br>▪ තාවකාලික තක්සේරුකරු | 01 | 01 |
| **එකතුව** | | 44 |

## 05. නීති අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 16 වන වගන්තිය ප්‍රකාරව පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා නීති අංශයේ ප්‍රධානියා වශයෙන් ද කටයුතු කරයි.


අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනෙක් (02) ද, සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරු සතරදෙනෙක් (04) ක් ද, සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරීන් විසිදෙදෙනෙක් (22) ක් ද, මෙම අංශයට අනුයුක්තව සිටිති.

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස 2016.11.24 දින සිට ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා කටයුතු කරයි. මෙම කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් ලෙස එස්.අයි.ජයසිංහ මහත්මිය සහ එම්.පී.ආර්.සෙනෙවිරත්න මහත්මිය යන මහත්මීන් කටයුතු කරනු ලබයි.

ස්වාධීන නීති අංශයක් කොමිෂන් සභාව සතු වන අතර,එකී අංශය විසින් සාක්ෂි ඇගයීම, චෝදනා හා අධි චෝදනා පත්‍ර සැකසීම සිදු කරනු ලබයි. තවද කොමිෂන් සභාව වෙනුවෙන් පැමිණිල්ලේ නඩුව මෙහෙයවීම නීති අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

### 5.1. 2017 වර්ෂයේ නඩු පැවරීම්.

| | මහේස්ත්‍රාත් අධිකරණය | මහාධිකරණය |
|---|---|---|
| වර්ෂයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | 32 | 41 |
| 2017.12.31 දිනට විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව | 111 | 277 |



### 5.2. 2017 වර්ෂයේ අධිකරණවල පැවරූ මුළු නඩු පිළිබඳ තොරතුරු

අධිකරණවල පැවරූ මුළු නඩු සංඛ්‍යාව ( 32+41) = 73

මහේස්ත්‍රාත් අධිකරණය

| අල්ලස් | දූෂණ | වත්කම් / බැරකම් හෙළි නොකිරීම | එකතුව |
|---|---|---|---|
| 07 | 19 | 06 | 32 |

මහාධිකරණය

| අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | එකතුව |
|---|---|---|
| 38 | 03 | 41 |

### 5.3 2014 සිට 2017 දක්වා පවරන ලද නඩු සංඛ්‍යාව.

| වර්ෂය | මහේස්ත්‍රාත් අධිකරණය | | | මහාධිකරණය | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | අල්ලස් | දූෂණ | අයුතු වත්කම් ඉපයීම | අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | |
| 2014 | 10 | 02 | 0 | 51 | 01 | 64 |
| 2015 | 13 | 09 | 10 | 76 | 0 | 108 |
| 2016 | 04 | 23 | 17 | 41 | 02 | 87 |
| 2017 | 07 | 19 | 06 | 38 | 03 | 73 |

## 5.4. 2017 වර්ෂයේ අවසන් කරන ලද නඩු සංඛ්‍යාව

මහේස්ත්‍රාත් අධිකරණය - 20

| | අල්ලස් | දූෂණ | වත්කම්/බැරකම් හෙළි නොකිරීම | එකතුව |
|---|---|---|---|---|
| වැරදිකරු | 02 | - | 16 | 18 |
| නිවැරදිකරු | 02 | - | - | 02 |

මහාධිකරණය - 69

| | අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | එකතුව |
|---|---|---|---|
| වැරදිකරු | 39 | - | 39 |
| නිවැරදිකරු | 29 | - | 29 |
| චූදිත මියයාම | 1 | - | 1 |

## 5.5. 2014 සිට 2017 දක්වා අවසන් කරන ලද නඩු සංඛ්‍යාව

| වර්ෂය | මහේස්ත්‍රාත් අධිකරණය | | | | | | මහාධිකරණය | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැරදිකරු | | | නිවැරදිකරු | | | වැරදිකරු | | නිවැරදිකරු | | |
| | අල්ලස් | දූෂණ | අයුතු වත්කම් ඉපයීම | අල්ලස් | දූෂණ | අයුතු වත්කම් ඉපයීම | අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | අල්ලස් | අයුතු වත්කම් ඉපයීම | |
| 2014 | 01 | - | - | - | - | - | 21 | - | 32 | 04 | 58 |
| 2015 | 05 | 02 | - | 04 | - | - | 08 | - | 32 | 01 | 52 |
| 2016 | 02 | - | - | 06 | - | - | 12 | 01 | 12 | 01 | 34 |
| 2017 | 02 | - | 16 | 02 | - | - | 39 | - | 29 | - | 88 |

## 06. පාලන අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පාලන අංශයේ කටයුතු අධ්‍යක්ෂ (පාලන) යටතේ ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (පාලන) වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරියෙකු වන ඒ.එම්.ආර්.එස්.ඒ.අදිකාරී මහතා කටයුතු කරයි.

### 6.1. 2017.12.31 දිනට නිතී සහ පාලන අංශ වලට අනුයුක්තව සිටින නිලධාරි සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව.

| තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| සභාපති | 1 | 1 | 0 |
| කොමසාරිස් | 2 | 2 | 0 |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| ලේකම් | 1 | 1 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 1 | 0 | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 5 | 2 | 3 |
| අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 |
| ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | 0 |
| සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (දූෂණනිවාරණ) | 1 | 0 | 1 |
| සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 0 | 1 |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 10 | 7 | 3 |
| සහකාර අධ්‍යක්ෂ (නීති) | 30 | 19 | 11 |
| ඉංජිනේරු | 1 | 0 | 1 |
| ගණකාධිකාරී | 3 | 0 | 3 |
| තක්සේරුකරු | 2 | 0 | 2 |
| සහකාර / නියෝජ්‍ය කොමසාරිස් | 1 | 0 | 1 |
| විගණන අධිකාරී | 1 | 0 | 1 |

| | | | |
|---|---|---|---|
| රේගු අධිකාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ ( ශ්‍රව්‍ය /දෘශ්‍ය) | 1 | 0 | 1 |
| පරිපාලන නිලධාරී | 3 | 0 | 3 |
| භාෂා පරිවර්තක | 4 | 2 | 2 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී | 1 | 1 | 0 |
| විමර්ශන නිලධාරී | 200 | 0 | 200 |
| බුද්ධි අංශ නිලධාරී | 10 | 0 | 10 |
| අයවැය සහකාර | 1 | 1 | 0 |
| සංවර්ධන නිලධාරී | 4 | 3 | 1 |
| දූෂණ නිවාරණ නිලධාරී | 50 | 0 | 50 |
| නීති සහකාර | 17 | 0 | 17 |
| ප්‍රවෘත්ති නිලධාරී | 1 | 0 | 1 |
| පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු | 2 | 0 | 2 |
| ප්‍රවාහන නිලධාරි | 1 | 0 | 1 |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ සහකාර | 3 | 1 | 2 |
| රාජ්‍ය කළමනාකරණ  සහකාර | 110 | *53 | 57 |
| ලඝු ලේඛක (සිංහල) | 4 | 0 | 4 |
| ලඝු ලේඛක (දෙමළ) | 2 | 0 | 2 |
| ලඝු ලේඛක (ඉංග්‍රීසි) | 4 | 0 | 4 |
| යතුරු ලේඛක (සිංහල) | 14 | 0 | 14 |
| යතුරු ලේඛක (දෙමල) | 4 | 0 | 4 |
| යතුරු ලේඛක (ඉංග්‍රීසි) | 4 | 0 | 4 |
| රියදුරු | 45 | 35 | 10 |
| ජලනල කාර්මික | 1 | 0 | 1 |

| | | | |
|---|---|---|---|
| වායු සමීකරණ කාර්මික ශිල්පී | 1 | 0 | 1 |
| පුස්තකාල සහායක | 1 | 0 | 1 |
| ලේඛන සහායක | 2 | 0 | 2 |
| කාර්යාල කාර්ය සහායක | 45 | 38 | 7 |
| පවිත්‍රතා කම්කරු | 20 | 0 | 20 |
| මුරකරු | 15 | 0 | 15 |
| **එකතුව** | **635** | **170** | **465** |

***තොරතුරු මූලාශ්‍රය : පාලන අංශය ඇසුරෙනි.***

### 6.2. මානව සම්පත් සංවර්ධනය

නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව සහ සඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා මානව සම්පත් කළමණාකරණය යටතේ පුහුණුවීම් ලබා දී ඇත.

- **2017 වර්ෂයේ දේශීය පුහුණු පාඨමාලා**

| අනු අංකය | පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණය පැවැත් වූ ආයතනය | පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණයේ නම | සහභාගී වූ නිලධාරීන් | පැවැත් වූ දිනය |
|---|---|---|---|---|
| 01 | නිපුනතා සංවර්ධන අරමුදල | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු පාඨමාලාව | කේ.ජී. හසිත ප්‍රභාෂ් මයා ( රා.ක.ස) | 2017.02.27 සහ 28 |
| 02 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | සැපයුම් ජාල කළමනාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව | කේ.ජී හසිත ප්‍රභාෂ් මයා( රා.ක.ස) | 2017.02.23 දින සිට බ්‍රහස්පතින්දා දින 05 ක් |
| 03 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | විදුලිජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව | ඊ.ඒ.වයි.දයාරත්න මයා( රා.ක.ස) | 2017.03.01 හා 02 |
| 04 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ගබඩාකරණය පිළිබඳ | කේ.ඩී.ඒ.චානක මයා ( රා.ක.ස) | 2017.03.24 දින සිට සිකුරාදා දින 05 ක් |
| 05 | නිපුනතා සංවර්ධන අරමුදල | කාර්යාල කාර්ය සහායකයින්ගේ වගකීම් හා කාර්යභාරය | එච්.එම්.පී.කේ.හේරත් මිය ආර්.ඩී.ඉසුරු සඳරුවන් මයා | 2017.05.25 හා 26 |
| 06 | ප්‍රාග් ආයතනය | වාහන කළමනාකරණය | එම්.ඒ.ලක්මල් මහතා ( රා.ක.ස) | 2017.06.28 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | ටී.සුජීවා ප්‍රියදර්ශණී මිය (සංවර්ධන නිලධාරී)<br><br>වයි.එම්.එල්.අයි.ඉරේෂා මෙය (රා.ක.ස) | 2017.07.04 හා 2017.07.05 |
| 08 | නිපුණතා සංවර්ධන අරමුදල | දුරකථන භාවිත හැකියාව හා ආචාර රීතිය පිළිබඳ පාඨමාලාව | යූ.ඒ.කොරලගේ මිය( කාන්තා පොලිස් සැරයන්) | 2017.07.17 හා 2017.07.18 |
| 09 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ආයතනික ඵලදායීතාවය උදෙසා කාර්යාල කාර්ය සහායකයින්ගේ කාර්යභාරය | ඩී.එල්.ඩී.තුසිත කුමාර මයා ( කා.සේ.සේ III)<br><br>ජේ.ආර්.ඩී.ජනක පුෂ්පකුමාර මයා (කා.සේ.සේ. III) | 2017.08.25 |
| 10 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ගබඩාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව | බී.එම්.සිසිර කුමාර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) | 2017.09.07 දින සිට බ්‍රහස්පතින්දා දින 05ක් |
| 11 | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | බී.එම්.සිසිර කුමාර මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර I) | 2017.10.19 දින සිට බ්‍රහස්පතින්දා දින 05 ක් |
| 12 | නිපුනතා සංවර්ධන අරමුදල | රාජකාරි කටයුතු සඳහා Ms Word, Ms Excel සහ විද්‍යුත් තැපැල සහ අන්තර්ජාලය | ආර්.එම්.කළණි විජේරත්න මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර III)<br><br>ඒ.පී.ගයනි මධුරංගි මෙය රාජ්‍ය (කළමනාකරණ සහකාර III)<br><br>ආර්.පී.ජේ.රාජපක්ෂ මිය රාජ්‍ය (කළමනාකරණ සහකාර III) | 2017.11.08 දින සිට බදාදා දින 05 ක් |
| 13 | ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය | තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ වැඩමුළුව | කේ.එම්.ආර්.ඩී.එස්. හේවාවසම් මිය ( සහකාර අධ්‍යක්ෂ -නීති) | 2017.11.15 |

- **2017 වර්ෂයේ විදේශ පුහුණු පාඨමාලා**

| අනු අංකය | පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණය පැවැත් වූ රට | පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණයේ නම | සහභාගී වූ නිලධාරීන් | පැවැත් වූ දින |
|---|---|---|---|---|
| 01 | ඩුබායි | ISS World middle East 2017 | විනිසුරු ඩබ්.එල්.රංජිත් සිල්වා මහතා | 2017.03.13 දින සිට 2017.03.15 දින දක්වා |
| 02 | උතුරු කොරියාව | 2017 ACRC Training Course – For International Anti – Corruption Practitioners | එම්. ආර් වයි.කේ.උඩවෙල මිය - (ස.අ.ජ) | 2017.04.17 දින සිට 2017.04.26 දක්වා |
| 03 | හොංකොං | The ICAC International Seminar on financial Investigation | සී.නෙවිල් ගුරුගේ මයා කොමසාරිස් III<br><br>සරත් ජයමාන්න මහතා අධ්‍යක්ෂ ජනරාල් | 2017.05.09 දින සිට 2017.05.12 දින දක්වා |
| 04 | සිංගප්පූරුව | Course on Singapore’s Anti – Corruption Strategies | තුෂාරි දයාරත්න මිය-ස.අ. (නීති) | 2017.05.29 දින සිට 2017.06.02 දින දක්වා |
| 05 | චීනය | 2017 Seminar on Financial Service and Co Operation for Developing Country | ඩබ්.එම්.ටී.ඩී.බණ්ඩාර මයා (ප්‍රධාන ගණකාධිකාරි) | 2017.06.02 දින සිට 2017.06.22 දක්වා |
| 06 | චීනය | 2017 Seminar on Population Sustainable Development and Poverty Reduction for Developing Countries | ඒ.එම්.ආර්.එස්.ඒ.අදිකාරි මයා ( අධ්‍යක්ෂ පාලන) | 2017.06.07 දින සිට 2017.06.21 දක්වා |
| 07 | වියානා | 8th Session of the Implementation Review Group of the UN Convention | විනිසුරු ලාල් රංජිත් සිල්වා මහතා ( කොමසාරිස් II) | 2017.06.14 දින සිට 2017.06.23 දින දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | Against Corruption | ජ.නී.සරත් ජයමාන්න මහතා (අධ්‍යක්ෂ ජනරාල්)<br><br>එම්.එම්.මුණසිංහ මෙය (ස.අ.ජ)<br><br>කේ.එච්.අයි.එස්.සිරිවර්ධන මිය (ස.අ.ජ) | |
| 08 | මලයාසියාව | Executive Certificate for Strategic Management of Anti Corruption Program | ජයන්තා පද්මිණී වීරසූරිය මිය - (නියෝජ්‍ය අධ්‍යක්ෂ විමර්ශන) | 2017.08.21 දින සිට 2017.08.23 දක්වා |
| 09 | වියානා | UNCAC Open – Ended Intergovernmental Working Group Meeting | ජේ.එම්.එස්.අයි. ජයසිංහ මිය - නි.අ.ජ<br><br>ඩී.අයි.රාජපක්ෂ මිය - ස.අ (නීති)<br><br>ඩබ්.එම්.ටී.ඩී.බණ්ඩාර මෙය - ස.අ. (නීති) | 2017.08.21 දින සිට 2017.08.23 දක්වා |
| 10 | මලයාසියාව | Conference on Sharing Experience on Corruption Management (3rd Team) | ඩී.ජී.ජේ.හෙයියන්තුඩුව මිය - ස.අ.ජ<br><br>අසිත ඇන්තනි මයා - ස.අ.ජ<br><br>▪ ජී.ඩී.මාදුවගේ මයා - ස.අ. (නීති)<br><br>▪ එස්.එම්.ඒ.ඒ.පී.කේ. සම්මන්දප්පෙරුම මිය - ස.අ.(නීති)<br>▪ කේ.එම්.ආර්.ඩී.එස්. හේවාවසම් මිය - ස.අ.(නීති)<br><br>▪ එස්.ඒ.බී.චේතනා මිය - ස.අ.(නීති)<br><br>▪ බී.ඩබ්.බී.යූ.කුමාරිහාමි මෙය - ස.අ.(නීති) | 2017.08.21 දින සිට 2017.08.25 දක්වා |
| 11 | මලයාසියාව | | ▪ කේ.කේ.සිරිවර්ධන මිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 2017.09.17 දින සිට 2017.10.07 දක්වා |
| 12 | ඊජිප්තුව | Six Session the Assembly of parties | ▪ එම්.පී.ආර්.සෙනවිරත්න මිය - නි.අ.ජ | 2017.10.02 දින සිට 2017.10.04 දක්වා |
| 13 | මලයාසියාව | 50th year Anniversary of | ▪ සරත් ජයමාන්න මහතා අධ්‍යක්ෂ ජනරාල් | 2017.10.01 |

| | | | | |
|---|---|---|---|---|
| | | celebration and Inauguration of MACC's New Headquarters Complex | | |
| 14 | මලයාසියාව | Development Administration Modernization and Transformation Program | ▪ ඒ.එම්.ආර්.එස්.ඒ.අධිකාරි මයා - අධ්‍යක්ෂ (පාලන) | 2017.10.21 දින සිට 2017.10.27 දක්වා |
| 15 | බැංකොක් | Invitation to the Presentation of Finding of the Regional Synthesis of the ACAS Initiative | ▪ විනිසුරු ඩබ්.එල්.ආර්.සිල්වා මහතා (කොමසාරිස් II) | 2017.10.25 |
| 16 | වියානා | 7th Session of the Conference of the States Parties to the UNCAC | ▪ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා (අධ්‍යක්ෂ ජනරාල්)<br>▪ ඩී.ප්‍රියන්ත චන්ද්‍රසිරි මයා අධ්‍යක්ෂ ( විමර්ශන) | 2017.11.06 දින සිට 2017.11.10 |
| 17 | දෝහා කටාර් | Human Resource Development and Management | ▪ ආර්.එම්.වී.එස්.ජයසේකර මිය -( ලේකම්) | 2017.11.13දින සිට 2017.11.16 |
| 18 | දකුණු කොරියාව | 22nd Steering and Advisory Group Meeting of ADB/OECD Anti-Corruption Initiative for Asia Pacific in South Korea | ▪ විනිසුරු ඩබ්.එල්.ආර්.සිල්වා මහතා (කොමසාරිස් II)<br>▪ එම්.එම්.මුණසිංහ මෙය (ස.අ.ජ) | 2017.11.15 දින සිට 2017.11.17 දක්වා |
| 19 | මාලදිවයින | Regional Workshop Whistle-Blower and Witness Protection in the Fight against Corruption in South Asia | ▪ විනිසුරු ඩබ්.එල්.ආර්.සිල්වා මහතා (කොමසාරිස් II)<br>▪ එම්.ආර්.වයි.කේ.උඩවෙල මිය - (ස.අ.ජ)<br>▪ කේ.එම්.ඒ.සිරිවර්ධන මිය ස.අ. (නීති) | 2017.11.22 දින සිට 2017.11.24 දක්වා |
| 20 | වොෂින්ටන් | Global Forum for Asset Recovery | ▪ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා අධ්‍යක්ෂ ජනරාල් | 2017.12.03 දින සිට 2017.12.11 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | | ▪ එම්.ටී.ටී. රුවන් කුමාර මයා සහකාර අධ්‍යක්ෂ (විමර්ශන)<br>▪ ඉන්දික ධර්මදාස මයා (පොලිස් පරීක්ෂක) | 2017.12.04 දින සිට 2017.12.06 දක්වා |

## 6.3. ප්‍රවාහන අංශය

2017 ජුනි 30 දින වන විට කොමිෂන් සභාව සතු මුළු වාහන සංඛ්‍යාව 48 කි. මින් 08 ක් යතුරු පැදි වේ. එය පහත වගුවෙන් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත

| වාහන පන්තිය | සංඛ්‍යාව |
|---|---|
| ද්විත්ව කාර්ය වාහන | 12 |
| මෝටර් කෝච් | 03 |
| මෝටර් කාර් | 17 |
| මෝටර් බයිසිකල් | 08 |
| මුළු සංඛ්‍යාව | 40 |

- **2017 අගෝස්තු මස කොමිෂන් සභාව වෙත වසර පහක් සඳහා කුලී පදනම මත ලබාගත් වාහන**

| වාහන පන්තිය | සංඛ්‍යාව |
|---|---|
| මෝටර් කාර් | 03 |
| වෑන් රථ | 05 |

## 7. මුදල් අංශය

කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යුතුව කටයුතු කරන මෙම අංශය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ ගණකාධිකාරීවරයෙකු වන ප්‍රධාන ගණකාධිකාරී ඩබ්.එම්.ඩී.බණ්ඩාර මහතාගේ මෙහෙයවීම යටතේ කාර්ය මණ්ඩල නිළධාරීන්ගේ සහාය සහිතව ක්‍රියාත්මක වේ. මූල්‍ය කළමනාකරණය, ගිණුම් වාර්තා සකස් කිරීම ඇතුළු පහත සඳහන් යටිතල පහසුකම් සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### 7.1. මුදල් අංශයේ කාර්යය භාරය.

සියලු මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීම හා ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ. එයට අමතරව කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම මෙන් ම ප්‍රාග්ධන හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමත් කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි මුද්‍රණ කටයුතු ඉටු කර දීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

මුදල් අංශයේ කාර්යයන් පහත පරිදි වේ.

- විමර්ශන අංශයේ හැර කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ වැටුප් ගෙවීම ඇතුළු සියලු ආකාරයේ ගෙවීම්.
- අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අත්තිකාරම්, උත්සව අත්තිකාරම්, ආපදා ණය ගෙවීම් සිදු කිරීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම
- වැටලීම්වලදී උපාය දූතයන් ලෙස ඊට සම්බන්ධවන නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමට වැටලීම් අත්තිකාරම් ගිණුම් පවත්වා ගෙන යාම.

### 7.2. වාර්ෂික ඇස්තමේන්තු සත්‍ය වියදම් සහ ඉතිරි කිරීම්

| 2017.12.31 දිනට | | | |
|---|---|---|---|
| විස්තරය | උපරිම වැය සීමාව රු. | අවම ලැබීම් සීමාව රු. | උපරිම හර සීමාව රු. |
| අත්තිකාරම් ' බී' ගිණුම | | | |
| විසර්ජන පනත යටතේ නියම කර ඇති සීමාව | 7,500,000.00 | 4,000,000.00 | 30,000,000.00 |
| 2017.12.31 දිනට ඇති සත්‍ය මුදල | 6,976,151.00 | 4,500,410.79 | 16,608,246.21 |
| වැටලීම් අත්තිකාරම් ගිණුම | | | |
| විසර්ජන පනත යටතේ නියම කර ඇති සීමාව | 150,000,000.00 | 2,000,000.00 | 275,000,000.00 |
| 2017.12.31 දිනට ඇති සත්‍ය මුදල | 3,109,000.00 | 2,689,920.00 | 18,952,381.98 |

*තොරතුරු මූලාශ්‍රය : මුදල් අංශය ඇසුරෙනි*

# 8. නිවාරණ ඒකකය

## 8.1. දැනුවත් කිරිමේ ක්‍රියාකාරකම්

2017 වර්ෂයේ දී අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ හා වැඩසටහන් ගණනාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හා නීති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

- **2017 වර්ෂයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් මෙහෙය වන ලද නිවාරණ හා අධ්‍යාපන වැඩසටහන්**

| අනු අංකය | ආයතනය | කොමිෂන් සභාවේ නිලධාරීන් | මාතෘකාව / විෂයය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වැලිගම | අනුරාධා සිරිවර්ධන මිය - ස.අ. (නීති) | අල්ලස් හා දූෂණය නිවාරණය | 60 |
| 02 | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | සරත් ජයමාන්න මයා (අධ්‍යක්ෂ ජනරාල්)<br><br>එස්.සිරිවර්ධන මිය ස.අ.ජ | නීතිපතිවරයාගේ කාර්ය භාරය හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 16 |
| 03 | රථවාහන පොලිස් මූලස්ථානය | ටී.බණ්ඩාර මෙය ස.අ. (නීති) | අල්ලස හා දූෂණය | 76 |
| 04 | අධිකරණ අමාත්‍යාංශය | ඩී.අයි.රාජපක්ෂ මිය ස.අ. (නීති)<br><br>ජී.මාදුවගේ මයා ස.අ. (නීති) | අල්ලස් නීතිය | 170 |
| 05 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | ආර්.වික්‍රමසිංහ මිය ස.අ.ජ | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යභාරය | 104 |
| 06 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාලය | එස්.සිරිවර්ධන මිය ස.අ.ජ<br><br>ඩී.අයි.රාජපක්ෂ මිය ස.අ. (නීති)<br>එස්.එම්.සබ්රි මයා ස.අ. (නීති) | අල්ලස, දූෂණය හා එහි බලපෑම | 250 |
| 07 | රථවාහන පොලිස් මූලස්ථානය | ආර්.වයි.කේ.උඩවෙල මිය - ස.අ.ජ | අල්ලස හා දූෂණය සම්බන්ධ නීතිය | 80 |
| 08 | විදේශ සේවා නියුක්ති කාර්යංශය, බත්තරමුල්ල | ටී.බණ්ඩාර මෙය ස.අ. (නීති) | අල්ලස හා දූෂණයෙන් වලකිමු | 150 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලය | ටී.බණ්ඩාර මෙය ස.අ.(නීති)<br><br>ඉන්දික මයා පො.ප | **අල්ලස හා දූෂණයෙන් වලකිමු** | 20 |
| 10 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලය | ඩී.අයි.රාජපක්ෂ මිය ස.අ. (නීති) | **අල්ලස හා දූෂණය** | 20 |
| 11 | සිංහ සමාජය තලංගම, මාලබේ. | එස්.සිරිවර්ධන මිය ස.අ.ජ.<br><br>ටී.බණ්ඩාර මෙය ස.අ. (නීති) | **අල්ලස හා දූෂණය** | 105 |
| 12 | පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය | විජේසිරි ලියනගේ මයා - පො.ප | **අල්ලස හා දූෂණය** | 20 |
| 13 | මධ්‍යම පරිසර අධිකාරිය | මනෝධි හේවාවසම් මිය ස.අ.(නීති) | **අල්ලස හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවය** | 150 |
| 14 | පොලිස් ස්ථානය - රාගම | ඩී.අයි.රාජපක්ෂ මිය ස.අ. (නීති)<br><br>නුවන්සිරි මයා | **අල්ලස් ගැනීමෙන් සිදුවන බලපෑම** | 60 |
| 15 | පර්යේෂන හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය | ඒ.සම්මන්දප්පෙරුම මිය - ස.අ.(නීති) | **අල්ලස හා දූෂණය** | 100 |

## 9. අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සම්බන්ධීකරණය

### 9.1 නීති සංශෝධනය කිරීම.

මෙම කොමිෂන් සභාවට අදාළ නීති සම්බන්ධයෙන් වසර 24 කට වැඩි කාලයක් කිසිදු සංශෝධනයක් සිදු කර නොමැත. අල්ලස හා දූෂණයට අදාළ නීති ශක්තිමත් කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ. තවද ලෝකයේ අනෙකුත් රටවල් අපරාධ සම්බන්ධයෙන් වන නව ප්‍රවණතා සළකා කලින් කලට නීති යාවත් කාලීන කිරීම සිදු කෙරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 156(අ) වගන්තිය අනුව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හා දූෂණයට එරෙහි ජාත්‍යන්තර සම්මුතීන්වලට අනුකූලව කටයුතු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇත.

ඒ අනුව මෙම කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වයට අදාළ නීති වන

- 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත
- 1994 අංක 11 දරන අල්ලස් පනත
- 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් මෙම කොමිෂන් සභාව විසින් සකස් කොට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලදී.එම යෝජනාව ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස 2017 නොවැම්බර් 07 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ඉහත නීති සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජිත පරිදි සංශෝධිත ව්‍යවස්ථා කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දෙන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුකූලව අදාළ නීති සංශෝධනය සඳහා නීති කෙටුම්පත් සම්පාදකතුමිය වෙත අවශ්‍ය සම්බන්ධීකරණය මෙම කොමිෂන් සභාව විසින් සිදු කෙරෙමින් පවතී.

### 9.2 ජාතික ක්‍රියාකාරී සැලැස්ම.

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි දූෂණ පිටු දැකීම උදෙසා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සැදිය යුතුව ඇත. ඒ සඳහා මේ වන විට රැස්වීම් ගණනාවක්ද සාකච්ඡා වට කිහිපයක් ද පවත්වා ඇත. ඊට අමතරව අන්තර් ජාතික විශේෂඥවරයෙක්ද ලංකාවට පැමිණ මේ සම්බන්ධයෙන් දායකත්වය දක්වා ඇත.

**අරමුණ**

ආර්ථික, සමාජීය,සංස්කෘතික,නීතිමය හා පාරිසරික ක්ෂේත්‍රයන්හි තිරසර සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා ශක්තිමත් ජාතික ක්‍රියාකාරී සැලැස්මක් තුළින් ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය පිටු දැකීම.

**පසුබිම**

ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ GSP + සහනය හිමි වුයේ 2017 වසරේ මැයි මස සිට බල පවත්වන පරිදිය. GSP + සහන ලබා දීමට නම් ශ්‍රී ලංකාව යුරෝපා සංගමයේ නීති හා රෙගුලාසි වලට අවනත විය යුතුව තිබිණි. එවැනි එක් අවශ්‍යතාවයක් වුයේ විධිමත් යහපාලන ක්‍රමවේදයක් පවත්වා ගෙන යාමයි. GSP + සහනය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව සිදු කරන කැප කිරීම් ප්‍රධාන කරුණු හතරක් යටතේ අධීක්ෂණය කරනු ලබන අතර එයින් "පාලන ක්‍රමවේදය" යන කරුණ යටතේ එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව විසින් සිදුකරන කැප කිරීම් පිළිබඳ නියාමනය කරනු ලබයි.

ලොවපුරා රටවලට බලපාන මාරක ව්‍යාධියක් ලෙස අල්ලස හා දූෂණය හඳුනාගෙන තිබේ. මෙම තර්ජනය මැඩ පවත්වනු වස් ජාත්‍යන්තර, කලාපීය හා ජාතික මට්ටමින් ප්‍රඥප්තීන්,නීති හා ක්‍රමවේදයන් විශාල සංඛ්‍යාවක් හඳුන්වා දී තිබේ. ඒ අනුව අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රධානතම නීතිමය ක්‍රමවේදය වන්නේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2003 වසරේදී සම්මත කරන ලද 2005 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතියයි. (UNCAC) 2004 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව මෙම සම්මුතිය පිළිගැනීමට අත්සන් තබන ලදී. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියෙහි කොටස්කරුවෙකු ලෙස එම සම්මුතියේ

සියළු විධිවිධාන පිළිපැදීමට ශ්‍රී ලංකාව බැඳී සිටින අතර විශේෂයෙන් ම එම සම්මුතියේ 5 (2) වගන්තිය අනුව දූෂණය පිටුදැකීම සඳහා නීතිමය හා පරිපාලන වටපිටාවක් සැකසීමට ශ්‍රී ලංකාවට සිදුව තිබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 156 "අ" ව්‍යවස්ථාවේ XIX "අ" පරිච්ඡේදය තුළින් අල්ලස හා දූෂණය පිළිබඳව විමර්ශනය කිරීමටත් එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි සම්මුතිය හා ශ්‍රී ලංකාව සම්බන්ධ වී ඇති දූෂණය මැඩලීම සඳහා වන අනෙකුත් ජාත්‍යන්තර ප්‍රඥප්තීන් අනුව ක්‍රියා කිරීමටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත බලය පවරා ඇත්තේය.

ඊට අමතරව ශ්‍රී ලංකාව විවෘත රාජ්‍ය පාලන හවුල්කාරීත්වයේ ද කොටස්කරුවෙකි. දූෂණ විරෝධී ප්‍රතිපත්තීන් ශක්තිමත් කිරීම සඳහා ද දූෂණ නිවාරණය සඳහා වූ දැවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ද එම කටයුතු සඳහා රාජ්‍ය, පෞද්ගලික හා සිවිල් යන ත්‍රෛපාර්ශවය සම්බන්ධ කර ගැනීම ද විවෘත රාජ්‍ය පාලන හවුල්කාරීත්වය යටතේ සිදු කළ යුතු කර්තව්‍යයකි. විවෘත රාජ්‍ය පාලන හවුල්කාරීත්වය සඳහා 2015 සිට 2017 කාලය සඳහා වූ ශ්‍රී ලංකා ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016 ඔක්තෝම්බර් 17 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

ඉහත කරුණු අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ හා අදාළ ආයතනවල අධීක්ෂණය යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2017.10.24 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත සිය අනුමැතිය ලබා දී තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ දූෂණය මර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරීම සඳහා පියවර රාශියක් අනුගමනය කළ යුතුව තිබේ

### NAPAC සකස් කිරිමේ ක්‍රමවේදය.

ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඒ සම්බන්ධ අනෙකුත් කටයුතු සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහාය ලබා ගනු වස් එකිනෙකා තුළ විශ්වාසය ඇති කිරීම හා සම්බන්ධතාවය වර්ධනය කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර තිබේ. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, සිවිල් සංවිධාන හා සාමාන්‍ය ජනතාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් ස්ථාපනය කිරීම හා උපදේශනයන් සිදු කිරීම ද මෙයට අයත් වේ. රාජ්‍ය අංශය, දූෂණ මර්ධන ආයතන, සිවිල් සමාජය, පෞද්ගලික අංශය,මාධ්‍ය,ප්‍රධාන වගවීමේ ආයතන විශේෂඥයින් හා සංවර්ධන සහකරුවන් අතරින් මෙම කණ්ඩායම්වල සාමාජිකයන් තෝරා ගනු ලැබේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හා අනෙකුත් ක්‍රම මගින් මේ හා සම්බන්ධ වීමට සාමාන්‍ය ජනතාව වෙත ද අවස්ථාව සළසා ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මහජන සහයෝගය ලබා ගැනීමටත් ඒ සඳහා ප්‍රසිද්ධියක් ලබා දීමටත් සාධනීය ලෙස මාධ්‍ය භාවිතා කරනු ඇත. දූෂණයේ අනිටු ප්‍රතිවිපාක පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටත් දූෂණ මර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් බවක් ලබා දීමටත් එය උපකාරී වනු ඇත.

2017.10.24 - ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

2017.11.28 - දූෂණය මර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා වන මාර්ග සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිළධාරීන් අතර හඳුනාගැනීමේ හමුවක් පැවැත්විණි.

### 9.3 අන්තර් ජාතික වගකීම්.

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා UNODC ආයතනය සමඟ නිරන්තර සම්බන්ධකම් පැවැත්වීමටත් සිදු වී ඇත. ඊට අමතරව දැනටමත් මැලේසියාව, භූතානය, හොංකොං සහ මුරුසි රාජ්‍යයන් සමඟ අල්ලස සහ දූෂණය තුරන් කිරිමේ වැඩපිළිවෙලට අදාළ තාක්ෂණික දැනුම හුවමාරු කර ගනිමින් සිටී.

### 9.4 සුපිළිපන්න වැඩසටහන්.

අල්ලස දූෂණය තුරන් කිරීමේ ප්‍රධාන සාධකයක් වන්නේ රාජ්‍ය ආයතන සඳහා සුපිළිපන්න වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. මේ සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ දැනටමත් සාකච්ඡා පවත්වා ඇති අතර ගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

### 9.5 විශේෂඥ විමර්ශකයන් සහ නිවාරණ ඒකකය.

මෙම කොමිෂන් සභාව සතුව කිසිදු විශේෂඥ විමර්ශකයෙක් නොමැති නිසා රාජ්‍ය සේවයේ ඊට අදාළ තනතුරු බිහි කර අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට සූදානම්ව ඇත. එසේම ඉතිහාසයේ කිසිදු දිනයක මෙම කොමිෂන් සභාව සතුව නිවාරණ නිලධාරීන් හෝ නිවාරණ ඒකකයක් පිහිටුවා නොමැත. නමුත් මේ වන විට රාජ්‍ය සේවයේ ඒ සඳහා තනතුරු නිර්මාණය කර ඇත. අවශ්‍ය බඳවා ගැනීම් නුදුරු අනාගතයේදී ම සිදු කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී.

### 9.6 නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම හා වෙනම සේවා ගණය.

පැමිණිල්ල මෙහෙයවීමත් විමර්ශනය සාර්ථකව සිදු කර ගැනීමත් උදෙසා දක්ෂ නීති නිලධාරීන් බඳවා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ඔවුන්ගේ වේතන හා දීමනා වැඩි කිරීමට දැනටමත් කැබිනට් පත්‍රිකාවක් සකස් කර ජනාධිපති ලේකම්තුමා වෙත යොමු කර ඇත. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු මෙම කොමිෂන් සභාවෙන් විමසා ඇත.

### 9.7 නව ගොඩනැගිල්ල ඉදි කිරීම.

මෙම කොමිෂන් සභාව ශක්තිමත් කිරීමේ ලා ප්‍රධානත ම බාධකය වී ඇත්තේ අවශ්‍ය ඉඩ පහසුකම් නොමැතිකමය. ඒ අනුව මෙම කොමිෂන් සභාව පිහිටි භූමියෙහි ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අවශ්‍ය සාකච්ඡා වට ගණනාවක් ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇත. එසේ වුවද තවමත් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිසි අනුමැතිය ලබා දී නොමැති නිසා එම වැඩකටයුතු සම්පූර්ණයෙන් පාහේ ඇණ හිට ඇත. එසේම වර්තමානයේ පවතින එක් ගොඩනැගිල්ලක් අනතුරුදායක තත්ත්වයට පත් වී ඇති බැවින් නිලධාරීන් කැප්පෙටිපොල මාවතේ පිහිටි පැරණි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ තාවකාලික ලෙස ස්ථාන ගත කර ඇත.

2017.06.01 ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ පර්ශව සමඟ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ජානාධිපති ලේකම් කාර්යාලයේ දී මූලික සාකච්ඡාවක් පවත්වන ලදී.

2017.06.12 ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පී. සුරේෂ් මහතාගේ ප්‍රධානත්වයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ දී සාකච්ඡාවක් පැවැත්වුණි

(මෙම සාකච්ඡා දෙකේදී ම කඩිනමින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට උපදෙස් හා සහයෝගය ලැබුණි.)

2017.06.14 නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යංශය (CECB) මඟින් සකස් කරන ලද ප්‍රාරම්භක සැලසුම් ඇතුලත් අයදුම්පතක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී.

2017.07.03 නාගරික සංවර්ධන අධිකාරිය විසින් නව කාර්යාල ගොඩනැගිල්ලක් සෑදීමට නිර්දේශ ලබා දුනි.

2017.07.04 ඉදිකිරීමට යෝජිත නව කාර්යාල ගොඩනැගිල්ලේ උස සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ නැවත වරක් සාකච්ඡාවක් පැවැත්වුණි.

2017.09.18 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පවත්වා ගෙන යනු ලබන අංක 36 දරණ ඉඩම හා බන්ධනාගාර කොමසාරිස් නිල නිවස පැවති අංක 36/69 සී ඉඩම එක් කර මූලික පිඹුරක් සකස් කරන ලදී.

2017.11.14 නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවේ තීරණයක් පරිදි මෙම කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට කොළඹින් පිටත ස්ථානයක් සොයා ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් අප වෙත දැන්වී ය.

2017.11.15 නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් අප වෙත දන්වා එවන ලදී.

ඒ අනුව නැවත වරක් මේ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සිදු කරන අතර නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගනිමින් පවතී.

## 9.8 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු අනුමත කර ගැනීම.

- **2017.06.02** දිනැතිව,

  සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු 05

  සහකාර අධ්‍යක්ෂ (දූෂණ නිවාරණ) තනතුරු 01

  දූෂණ නිවාරණ නිලධාරී තනතුරු 09 ක් අනුමත කර ඇත.

- 2017.06.06 දිනැතිව පුරප්පාඩුව පවතින විමර්ශන අංශයේ තනතුරු 200 ක් යටපත් කර විමර්ශන නිලධාරී තනතුරු 200 ක් අනුමත කර ඇත.

- **2017.09.25** දිනැතිව,

  සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (දූෂණ නිවාරණ) තනතුර සංශෝධනය කර

  සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරු 01 ක් ද,

  දූෂණ නිවාරණ නිලධාරී තනතුරු 25 ක් ද අනුමත කර ඇත.

## 9.9 නිලධාරීන් බඳවා ගැනීම.

- නව රියදුරු මහතුන් 03 දෙනෙක් බඳවාගෙන ඇත.
- සහකාර අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරීන් තිදෙනෙකු උසස් කර ඇත.

## 9.10 පුරප්පාඩු පිරවීම.

නව බඳවාගැනීම් සිදු කළ හැකි වූයේ ඉහත තනතුරු සඳහා පමණක් වුව ද, බඳවා ගැනීම් සිදු කිරීම හා පුරප්පාඩු පිරවීමට අදාළව සිදු කළ කටයුතු වලින් කිහිපයක් පහත පරිදි වේ.

- රියදුරු පුරප්පාඩු 05 ක් සඳහා බඳවාගැනීම් සිදු කිරීමට 2017.01.09 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගෙන ඇත. එම රියදුරු පුරප්පාඩු 05 හා තවත් පුරප්පාඩු 01 ක් ලෙස පුරප්පාඩු 06 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. 2017.05.29 දිනැතිව රියදුරු පුරප්පාඩු පිරවීමට අදාළ දැන්වීම් පළ කර ඇත. 2017.10.10,11 හා 12 දිනවල දී අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.

- 2017.09.12 දිනැතිව සහකාර අධ්‍යක්ෂ (දූෂණ නිවාරණ) තනතුර ඇති කිරීමට මු.රෙ.71 ට අනුව ඉල්ලීම් සිදු කිරීම හා එම තනතුර අනුමත කර ගැනීමට අදාළ කටයුතු ද මෙම වසර තුළ දී සිදු කරන ලදී.

- දූෂණ නිවාරණ නිලධාරී බඳවා ගැනීම් පරිපාටියේ කෙටුම්පත ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් වෙත හා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම හා ඒ සඳහා අදාළ කටයුතු ද සිදු කර ඇත. නීති සහකාර තනතුරේ බඳවා ගැනීම් පරිපාටියේ කෙටුම්පත ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් වෙත හා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම සඳහා අදාළ කටයුතු සිදු කර ඇත. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ දැනුම් දීම මත මෙම තනතුරු දෙකෙහිම බඳවා ගැනීම් පරිපාටි එක් කර ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය සකස් කරන ලදී.

- කාර්යාල සේවක සේවයේ බඳවා ගැනීම් වලට අදාළ කටයුතු ද සිදු කර ඇත.

- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ළඝු ලේඛක හා යතුරු ලේඛක තනතුරෙහි බඳවා ගැනීම් පරිපාටියේ අදාළ කටයුතු, ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයන් පැවැත්වීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමේ කටයුතු හා ගැසට් නිවේදනය සකස් කිරීමේ කටයුතු සිදු කිරීම.

- විමර්ශන නිලධාරී තනතුර ඇති කිරීම පිළිබඳ විවිධ රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම, තනතුරු අනුමත කර ගැනීම හා බඳවා ගැනීම් පරිපාටියේ කෙටුම්පත ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමු කර අදාළ නිර්දේශයන් ලබා ගැනීමත්, එම බඳවා ගැනීම් පරිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමත් සිදු කර ඇත.

- ප්‍රවාහන නිලධාරී තනතුරට බඳවා ගැනීම් කිරීම සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ කටයුතු කිරීම හා ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීමේ කටයුතු සිදු කිරීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම,අයදුම්පත් කැඳවීම හා සම්මුඛ පරීක්ෂණයට අදාළ කටයුතු සිදු කිරීම.

මීට අමතරව, රාජ්‍ය ආයතන මඟින් පුරප්පාඩු පිරවීමට අදාළව ඉල්ලන ලද වාර්තාවන් සඳහා තොරතුරු සැපයීම ඇතුළු බඳවා ගැනීම් කටයුතුවලට අදාළ රාජකාරි කටයුතු 2017 වර්ෂය තුළ සිදු කර ඇත.

************************************